සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2024

# පුරවැසි අධ්‍යාපනය

**08 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- **අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නිදහස් අධ්‍යාපනයට අදාළ යෝජනා සම්මත වූ වර්ෂය වන්නේ,

    (1) ක්‍රි.ව. 1948 (2) ක්‍රි.ව. 1945

    (3) ක්‍රි.ව. 1950 (4) ක්‍රි.ව. 1951

02. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක කාර්ය මණ්ඩලයට අයත් නොවන්නේ,

    (1) වැඩ මූලික (2) ප්‍රාදේශීය ඉංජිනේරු

    (3) මනු කියවන්නන් (4) ජලනළ වැද්දුම්කරුවන්

03. වර්තමාන සමාජය තුළ ළමයින්ට මුහුණදීමට සිදුවන ගැටලුවක් වන්නේ,

    (1) හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරතවීම.

    (2) ගුරුවරුන්ට ගරු කිරීම.

    (3) විවිධ අපචාර ක්‍රියාවලට යොදාගැනීම.

    (4) පාසලේ නීතිරීති ආරක්ෂා කිරීම.

04. නායකයකු සතු විය යුතු සන්නිවේදන හැකියාවක් වන්නේ,

    (1) මිත්‍රශීලී බව (2) තීරණ ගැනීම

    (3) කථනය (4) සමාජශීලී බව

05. මන්ත්‍රීවරයාගේ අනුගාමිකයන් වන්නේ,

    (1) රටවැසියන් (2) ඡන්ද දායක දායිකාවන්

    (3) ගුරු මණ්ඩලය (4) පවුලේ සාමාජිකයන්

- **අංක 06 - 10 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. පුද්ගලයා තුළ ඇතිවන විවිධ චිත්තවේග ස්වභාවයන් ඔවුන්ගේ හැසිරීම කෙරෙහි බලපායි. ( )

07. මිනිසා විසින් අයත් කරගෙන ඇත්තා වූ දැනුම, විශ්වාස, කලා, සිරිත් විරිත්, ජීවනෝපාය ආදී සියල්ල සංස්කෘතියයි. ( )

08. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩගැසී ඇත්තේ ආගම මුල්කරගෙන ය. ( )

09. කාලගුණික හා දේශගුණික විපර්යාසයකට උදාහරණයකි භූ චලන. ( )

10. නික් වුජිසික් යනු උපතින් ආබාධිත තත්ත්වයට පත්ව සිය ජීවිත අභියෝග ජයගත් පුද්ගලයෙකි. ( )

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.**

(සමෙහි ස්පර්ශ වීමෙන් / අභියෝග / ශ්‍රම බළකාය / ජපානයේ / චීනයේ / අභිමානය / විසඳුම් / අනාරක්ෂිත ලෙස ගබඩා කිරීම)

11. 1906 දී ..................................................... උපත ලද සොයිචිරෝ හොන්ඩා මහතා ප්‍රවාහන පහසුකම් සලසා දුන්නේ ය.

12. තමන් කරන රැකියාව ගැන තමන් ම .................................................. ඇතිකර ගැනීම ශ්‍රම අභිමානය නම් වේ.

13. රටක සංවර්ධනයේ ප්‍රබල ම සාධකය ......................................................................... වේ.

14. යම් ගැටලුවකින් මිදීමට නම් ඒ සඳහා ................................................ සෙවීම අතිශයින් වැදගත් වේ.

15. රසායනික ද්‍රව්‍ය ශරීරගත විය හැකි ක්‍රමයක් වන්නේ ............................................................................ ය.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා (A) හා (B) තීරු ගළපා නිවැරදි අක්ෂරය වරහන තුළ යොදන්න.**

| | (A) | | | (B) |
|---|---|---|---|---|
| 16. | 1959 | ( ) | A | උල්කාපාත කඩාවැටීම |
| 17. | අකුණු කුණාටු | ( ) | B | ඇමෙරිකා එක්සත් ජනපදය |
| 18. | සුනාමි | ( ) | C | ශ්‍රී ලංකා ජාතික රෝහල |
| 19. | ටෙක්සාස් | ( ) | D | චක්මා |
| 20. | ඉන්දියාව | ( ) | E | සංවහන ක්‍රියාවලිය |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බ්‍රිතාන්‍ය පාලන යුගයේ මෙරට ආරම්භ කළ සේවා දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) සමුපකාර සමිතියේ ආදර්ශ පාඨය ලියා දක්වන්න. (ල. 02)

(iii) පොලිස් ස්ථානයක කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

(iv) ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනය නම් කරන්න. (ල. 02)

(v) සමාජය තුළ නායකත්ව ලක්ෂණ දැකිය හැකි අවස්ථා දෙකක් නම් කරන්න. (ල. 02)

(vi) බහු සංස්කෘතික සමාජ පවතින රටවලට උදාහරණ දෙකක් සපයන්න. (ල. 02)

(vii) පහත රූපවලින් දැක්වෙන ආගමික ස්ථාන නම් කරන්න. (ල. 04)

|  |  |  |  |
|---|---|---|---|
| A | B | C | D |

(viii) හින්දු භක්තිකයන් පුද පූජා පවත්වන දෙවිවරු හතරදෙනෙකු නම් කරන්න. (ල. 04)

(මුළු ලකුණු 20 යි.)

02. (i) පහත රූපවලින් දැක්වෙන පොදු සේවා නම් කරන්න. (ල. 03)

|  |  |  |
|---|---|---|
| A | B | C |

(ii) ඉහත A අක්ෂරයෙන් දැක්වෙන සේවා අංශය මගින් ඉටුකරන කාර්යයන් හතරක් ලියා දක්වන්න. (ල. 04)

(iii) එම සේවා අංශය යහපත් තත්ත්වයක පැවතීමට බලපාන හේතු තුනක් ලියා දක්වන්න. (ල. 03)

03. (i) ළමා අයිතිවාසිකම් වර්ග කෙරෙන තේමා තුනක් නම් කරන්න. (ල. 03)

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කරදීමට ක්‍රියාත්මක වන ආයතන දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) (a) ප්‍රාදේශීය මට්ටමෙන් දරුවන් හා පවුල් සඳහා සේවා සපයන පහත නිලධාරීන්ගේ කාර්යයන් ලියා දක්වන්න. (ල. 03)

1. සමාජ සේවා නිලධාරී
2. මුල් ළමාවිය ආරක්ෂක නිලධාරී
3. කාන්තා සංවර්ධන නිලධාරී

(b) ළමා අයිතිවාසිකම් භුක්ති විඳින ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ල. 02)

04. (i) නායකයකු සතු විය යුතු ගුණාංග තුනක් ලියා දක්වන්න. (ල. 03)

(ii) සමාජය තුළ දැකිය හැකි නායකත්ව ශෛලීන් දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) නායකයකු සමාජයට අවශ්‍ය වීමට හේතු තුනක් සඳහන් කරන්න. (ල. 05)

05. (i) සංස්කෘතිය යන්නට මහාචාර්ය විමල් දිසානායකයන්ගේ නිර්වචනය ලියා දක්වන්න. (ල. 03)

(ii) බහු සංස්කෘතික සමාජයක ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(iii) (a) හින්දු ආගම හා බැඳුණු ප්‍රධාන සංස්කෘතික උත්සව දෙකක් නම් කරන්න. (ල. 02)

(b) රටක ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගාගැනීමේ වාසි 3 ක් ලියා දක්වන්න. (ල. 03)

06. (i) මිනිසා මුහුණ දෙන ගැටලු වර්ග තුනක් ලියා දක්වන්න. (ල. 03)

(ii) ගැටලු විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(iii) අභියෝග ජය ගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සමාජීය නිපුණතා තුනක් නම් කොට ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

07. (i) වැඩ ලෝකය තුළ වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන තුනක් නම් කරන්න. (ල. 03)

(ii) යහපත් ශ්‍රමිකයකු සතු ගුණාංග දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(iii) (a) සේවකයකු සතු අයිතිවාසිකම් දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(b) පෞද්ගලික වෘත්තීය ගුණාංග පුහුණු කර ගැනීම සඳහා භාවිත කළ හැකි විවිධ ඉගෙනුම් ක්‍රම තුනක් ලියා දක්වන්න. (ල. 03)

## පිළිතුරු පත්‍රය

**I කොටස**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 1 | (03) | 3 | (04) | 3 | (05) | 2 | (06) | ✓ | (07) | ✓ | (08) | ✓ |
| (09) | × | (10) | × | (11) | ජපානය | | | (12) | අභිමානය | (13) | ශ්‍රම බලකාය | | | | |
| (14) | විසඳුම් | (15) | සමෙහි ස්පර්ශ වීමෙන් | | | | | (16) | C | (17) | E | (18) | A | | |
| (19) | B | (20) | D | | | | | | | (ලකුණු 2 x 20 = 40 යි.) | | | | | |

**II කොටස**

01. (i)